**වීරකැටිය ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 07 දින ද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට වීරකැටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයන්වලදී විවිධ පාර්ශවයන් විසින් ප්‍රාදේශීය සභාවට ඔප්පු මගින් පවරා දී තිබූ එකතු වටිනාකම වූ රු.913,625 ක්වූ ඉඩම් 29 ක් ගිණුම්ගත කර නොතිබුණි | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ සහ පරිත්‍යාග ලෙස ලද වත්කම් 33 ක එකතු වටිනාකම වූ රු. 686,240 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂයන් වලදී ප්‍රාදේශීය සභාව විසින් ඉදිකර තිබූ ගොඩනැගිලි 06 ක එකතු වටිනාකම වූ රු. 6,763,967 ක් ගිණුම්ගත කර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (iv) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු. 237,110 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයේ ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ගිණුම සැකසීමෙන් පසුව මුදල් ලැබී ඇති බැවින් ගිණුමට නොගන්නා ලදී |
| (v) | සමාලෝචිත වර්ෂයේදී ලැබුනු මන්ත්‍රී ප්‍රතිපාදන වලින් සභාවේ යන්ත්‍රෝපකරණ භාවිතා කර ඉදි කළ මාර්ග 05 ක් සඳහා රු. 525,000 ක ණයහිමි ප්‍රතිපාදන ඇති කර තිබුණි. | නිවැරදි ණයහිමි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | සභාවේ යන්ත්‍රෝපකරණ භාවිතා කළද යන්ත්‍රෝපකරණ සඳහා වෙනමම ජංගම ගිණුමක් පවත්වා ගෙන යන නිසා ණයහිමි ප්‍රතිපාදන ඇති කළෙමි |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 03 කට අදාළ එකතුව රු. 5,754,964 ක් වූ ශේෂ, ඊට අදාළ උපයෝගී ලේඛන/ලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු. 213,577 ක අසමානතා පැවතුණි. | වෙනස්කම් සසඳා ශේෂ නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කරමි |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු. 470,291,634 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | වත්කම් ලේඛන විධිමත්ව යාවත්කාලීන කිරීම සහ විස්තරාත්මක උපලේඛන සකස් කර ඉදිරිපත් කරමි |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සසඳා අතිරික්තතා හා ඌනතා වලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ . | කඩිනමින් සකස් කර ඉදිරිපත් කරමි |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 702(3) | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ . | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො /2010/01 දරන චක්‍රලේඛයේ 05 ඡේදය | කඩ කාමර 57 ක ගිවිසුම් වසර 3 කට වරක් යාවත්කාලීන කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ . | සියලු ගිවිසුම් යාවත්කාලීන කරන ලදී |
| (ඇ) | නාගරික සංවර්ධන හා ප්‍රජා භූමි අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ v වන උපලේඛනයේ (1)(V) උප වගන්තිය | සභා බල ප්‍රදේශයේ ඉදි කර තිබූ සම්ප්‍රේෂණ කුළුණු සඳහා ගාස්තු අයකර නොතිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | සම්ප්‍රේෂණ කුළුණු පිළිබඳ සමීක්ෂණයක් සිදු කර සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කරමි |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම, රු.13,601,699 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,040,909 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,740,000 | 1,909,941 | 1,364,750 | 4,966,389 | 1,782,500 | 1,883,302 | 2,237,777 | 4,447,880 |
| කුලී | 17,356,000 | 17,165,685 | 16,308,004 | 3,206,486 | 14,401,800 | 13,680,993 | 13,516,772 | 2,556,651 |
| බලපත්‍ර ගාස්තු | 1,787,000 | 1,724,170 | 1,688,086 | 126,367 | 1,520,900 | 1,744,575 | 1,745,417 | 96,158 |
| වෙනත් ආදායම් | 10,153,000 | 13,261,847 | 5,742,832 | 32,969,481 | 12,014,000 | 11,940,798 | 4,947,136 | 19,654,715 |
| එකතුව | 56,537,200 | 34,061,643 | 25,103,672 | 41,268,723 | 29,719,200 | 29,249,668 | 22,447,102 | 26,755,404 |

**2.2.2** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු. 26,775,404 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු. 34,061,643 ක් විය. ඒ අනුව වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු. 60,817,047 ක් වුවද, වර්ෂය තුළ රැස්කරන ලද ආදායම රු. 25,103,672 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 41 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | පළාත් සභාවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.මිලි 32 ක් වීම නිසා විශාල හිඟයක් පෙන්වන අතර කඩිනමින් මුදල් ගෙන්වා ගැනීමට ඉල්ලීම් කර ඇත. එය ලද පසු ප්‍රගතිය 85% කි |

**2.2.3** **වරිපනම් හා බදු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ වරිපනම් හා බදු ආදායම රු. 4,447,880 ක් වූ අතර, වර්ෂයේ බිල් කිරීම් රු. 1,909,941 ක් විය. මේ අනුව වර්ෂය තුළ අයවිය යුතු වරිපනම් හා බදු ආදායම රු. 6,357,821 ක් වුවද, රැස්කළ ආදායම රු. 1,364,750 ක් වීමෙන්, වරිපනම් හා බදු ආදායම රැස් කිරිමේ ප්‍රගතිය සියයට 21 ක මට්ටමක පැවතුණි. | වරිපනම් අයකිරීමේ ප්‍රගතිය වැඩිකර ගත යුතුවේ. | වරිපනම් රැස් කිරීමේ ප්‍රගතිය ඉහළ නංවාලීමට විශේෂ වැඩපිළිවෙලක් සකස් කරන ලදී |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වරිපනම් බදු ආදායම රු. 4,938,581 ක් වූ අතර හිඟය අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | වැඩපිළිවෙලක් සකස් කර හිඟය අයකර ගැනීමට කටයුතු කරමි |

**2.2.4** **බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත බලපත්‍ර ගාස්තු ආදායම රු. 1,787,000 ක් වූ අතර, බිල්කළ ආදායම රු. 1,724,170 ක් විය. මේ අනුව ඇස්තමේන්තුගත ආදායමින් සියයට 96 ක් පමණක් බිල්කිරීම් කර තිබුණි. | ඇස්තමේන්තු නිවැරදිව සැකසිය යුතුවේ. | සත්‍ය වශයෙන් පැවති ස්ථාන සඳහා බිල් කිරීම් කර ගාස්තු අය කරමි |

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 680,358 ක් හා රු. 32,289,123 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අය කිරීමට කටයුතු කරමි |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| (විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 17 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා 13 න් 10 ක් සඳහා බලය දී නැති අතර අනෙකුත් කාරණා සඳහා වෙනත් රාජ්‍ය ආයතන පිහිටුවා ඇත |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ඉටු වන සේ වැඩසටහන් සකස් කර ප්‍රතිපාදන වැය කළෙමි |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේදී කළමනාකරණ තොරතුරු පද්ධති 03 ක් මිලදී ගැනීමට පෞද්ගලික ආයතනයකට රු. 317,250 ක් ගෙවා තිබුණද ඒවා නිසි අයුරින් ක්‍රියාත්මක නොවූ අතර, ගැළපෙන පරිදි සංවර්ධනය කර ගැනීමටද කටයුතු කර නොතිබුණි. | මෙම පද්ධති ගැළපෙන පරිදි සංවර්ධනය කර ප්‍රශස්ථ ක්‍රියාකාරී මට්ටමකින් පවත්වාගත යුතුවේ. | ගැළපෙන පරිදි සංවර්ධනය කර ගැනීම සඳහා අදාළ ආයතන සමඟ සාකච්ඡා සිදු කරන ලදී |
| (ආ) | 2018 වර්ෂය සඳහා වාහන ආදායම් බලපත්‍ර ලබා ගැනීමේදී ගෙවා තිබුණු රු. 63,679 ක දඩ මුදල වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වගකිව යුතු නිලධාරීන්ගෙන් දඩ මුදල අයකර ගත යුතුවේ. | නිදහස් බලපත්‍ර නිසා වර්ෂ ගණනාවක සිට ආදායම් බලපත්‍ර ලබාගෙන නැත. නමුත් 2018 වර්ෂයේදී ආදායම් බලපත්‍ර ලබා ගැනීමේදී හිඟ මුදල සඳහා දඩ අයකළ බැවින් සභා අරමුදලින් දඩ මුදල ගෙවන ලදී |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 15 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 04 ක්වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | සේවක පුරප්පාඩු 10 ක් බඳවා ගැනීම සඳහා කටයුතු කරන අතර ඉතිරි පුරප්පාඩු 05 සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී ඇති බැවින් බඳවා ගැනීමට කටයුතු කරමි |
| (ආ) | සභාවේ නිලධාරීන් 05 දෙනෙකු අනුමත රාජකාරි වලින් බැහැර රාජකාරිවල යොදවා තිබුණි | නිලධාරීන් අනුමත රාජකාරියේ යෙදවිය යුතුවේ. | සේවකයින්ගේ පුරප්පාඩු පැවති බැවින් අත්‍යාවශ්‍ය රාජකාරිවල යොදවා ඇති අතර නව සේවකයින් බඳවාගත් පසු අනුමත රාජකාරි කටයුතු පවරමි |
| (ඇ) | සේවය හැර ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු එකතු වටිනාකම රු. 237,066 ක සේවක ණය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | සේවක ණය අයකර ගත යුතුවේ. | සේවක ණය වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කරමි |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වලස්මුල්ල සුපිරි වෙළඳ පොළ කඩ කාමර සඳහා 2017 ජුනි 29 දින ලැබී තිබූ තක්සේරු කුලිය මත කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු කුලිය අයකළ යුතුවේ. | ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය පරිදි 2018 ඔක්තෝබර් දක්වා සියයට 50 ක් අඩුකර අයකළ අතර ඉන්පසු තක්සේරු කුලිය අය කරමි |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු සුසාන භූමි 67 ක නීත්‍යානුකූල අයිතිය 2018 දෙසැම්බර් 31 දින වන විටත් පවරා ගෙන නොතිබුණි. | ඉඩම්වල අයිතිය පවරාගත යුතුවේ. | සුසාන භූමි 67 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කරමි |

**3.5.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයේදී රු. මිලි.12 ක් වැය කර ඉදි කර තිබූ ආදාහනාගාර ගොඩනැගිල්ල ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ වන විට ආදාහනාගාරයේ අත්‍යාවශ්‍ය කටයුතු සියල්ල නිම කර ඇති බැවින් කඩිනමින් විවෘත කිරීමට කටයුතු කරමි |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආදායම් විෂයයන් 02 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 6,822,656 ක් වූ අතර එය සියයට 20 සිට සියයට 23 ක් දක්වා පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | කුලී ආදායම් සියයට 50 ක් අයකිරීම හා මුද්දර ගාස්තු ආදායම නොලැබීම මත ආදායම අඩු වී ඇත. |
| (ආ) | වියදම් විෂයයන් 04 ක එකතුව රු. 5,379,358 ක් වූ ඉතිරිවීම් පැවති අතර එය සියයට 27 සිට සියයට 69 ක් දක්වා පරාසයක විය. | තාත්වික ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | පෙර වර්ෂ වලට සාපේක්ෂව අරපිරිමැස්මෙන් ද්‍රව්‍ය භාවිතා කළ බැවින් වැය ශීර්ෂවල මුදල් ඉතිරි විය |